# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 පෙබරවාරි මස 03 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2022.02.07 දින නිකුත් කරන ලදී)


# අධිහාර බද්ද

**අධිහාර බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# අධිභාර බද්ද

එල්.ඩී.-ඕ. 2/2022

**අධිභාර බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක   දරන අධිභාර බද්ද පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අධිභාර බද්ද පැනවීම

**2.** (1) මේ පනතේ මතු සඳහන් විධිවිධානවලට යටත්ව, ( මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිභාර බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් -

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහසක් ඉක්මවනු ලබන යම් පුද්ගලයකුගේ, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක, බදු අයකළ හැකි ආදායම මත සියයට විසිපහක අනුප්‍රමාණයකට අයකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, බදු අයකළ හැකි ආදායම මත හවුල් ව්‍යාපාරය විසින් බද්ද ගෙවා ඇත්නම්, මේ ඡේදය යටතේ තනි පුද්ගලයකු වශයෙන් යම් හවුල්කරුවකුගේ බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේ දී, හවුල් ව්‍යාපාරයකින් උපචිත වන යම් හවුල්කරුවකුගේ ආදායම පිළිබඳ සලකා බලනු නොලැබිය යුතු ය; සහ

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගමේ, ප්‍රකාරව ගණනය කරනු ලබන සමස්ත බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහසක් ඉක්මවනු ලබන එම සමාගම්වල එක් එක් සමාගමක බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහසක් නොඉක්ම වුව ද, එය නොතකා, එම

තක්සේරු වර්ෂය සඳහා එම එක් එක් සමාගමක බදු අයකළ හැකි ආදායමෙන් කොටසක් වන්නා වූ පාලිත සමාගමේ ලාභාංශ තුළින් උපචිත වන ඉපයීම් සහ ලාභ අඩු කිරීමෙන් පසුව, එම එක් එක් සමාගමේ බදු අයකළ හැකි ආදායම මත සියයට විසිපහක අනුප්‍රමාණයකට අයකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ බදු අයකළ හැකි සමස්ථ ආදායම ගණනය කිරීමේ දී, පාඩු හෝ හෙළිදරව් නොවූ පාඩු හේතුවෙන් ශූන්‍ය වටිනාකමක් සහිත එම සමාගම් සමූහයේ යම් පාලිත සමාගමක් හෝ පාලක සමාගමක් පිළිබඳ සලකා බලනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් යම් සමාගමක ගිණුම් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් මාස දොළහක විකල්ප කාලසීමාවක් සඳහා අනුමතිය ලබා දී ඇති අවස්ථාවක දී, මේ පනතේ කාර්ය සඳහා එම අනුමත කාලසීමාව 2020 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂය ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම යම් තනි පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් සහ සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගම විසින් ම කොමසාරිස්-ජනරාල්වරයා වෙත 2022 මාර්තු මස තිස් එක් වන දිනයේ දී සහ 2022 ජූනි මස තිස් වන දිනයේ දී හෝ ඒ දිනවලට පෙරාතුව සමාන වාරික දෙකකින් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින් බද්ද එකතු කරනු ලැබිය යුතු අතර එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(6) සමාගම් සමූහයක පාලිත සාමාගමක හෝ පාලක සමාගමේ යම් තදන්තර ඇවර කිරීමක් මත මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් වීමෙන් ඒ සමාගම නිදහස් නොකළ යුතු ය.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා -

(අ) මේ පනත යටතේ අයකරනු ලබන බද්ද, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශයේ වූ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේ දී, මේ පනත යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය;

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ මූල්‍ය සේවා සැපයුම මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ දී, මේ පනත යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්යය සඳහා "බදු අයකළ හැකි ආදායම" යන්නෙන් -

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී සිටින්නා වූ ද, ඒ ගිවිසුමේ දක්වා ඇති බදු වලින් නිදහස් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ඒ ගිවිසුමට අනුව නිශ්චය කරන ලද ආදායම් බදු ගෙවීමට යටත් වී සිටින්නා වූ ද සමාගමකට අදාළව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයට අනුව ඒ සමාගමේ ආදායම් බදු සහ මේ පනත යටතේ අයකරනු ලබන බද්ද ගෙවීමට පෙර පැවති ලාභය අදහස් වේ;

(ආ) තනි පුද්ගලයෙකුට, හවුල් ව්‍යාපාරයකට හෝ (අ) ඡේදයේ සඳහන් සමාගම් හැර සමාගමකට සහ සමාගම් සමූහයක පාලිත සමාගමකට සහ පාලක සමාගමට අදාළව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

බදු වාර්තාව සැපයිය යුතු බව

**3.** (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් සහ සෑම සමාගම් සමූහයක ම පාලිත සමාගම් සහ පාලක සමාගම විසින්, කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව එසේ නියමිත තොරතුරු ඇතුළත් බදු වාර්තාවක් 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙරාතුව කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිතව සපයනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස්-ජනරාල්වරයා විසින් -

(අ) බදු වාර්තාව සඳහා වන ආකෘතිය;

(ආ) බදු වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ බදු වාර්තාව සමග ගොනු කළ යුතු ඇමුණුම් ඇත්නම් ඒ ඇමුණුම්; සහ

(ඇ) ගොනු කළ යුතු ආකාරය,

නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ කාර්යය සඳහා, (1) වන උපවගන්තිය යටතේ සපයනු ලබන බදු වාර්තාවක්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ වන "බදු වාර්තාවක්" ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ස්වයං-තක්සේරු කිරීමකට හේතු විය යුතු ය.

බද්ද ගෙවීම පැහැරහැරීම

**4.** (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් යම් පුද්ගලයෙකු, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් හෝ යම් සමාගම් සමූහයක පාලිත සමාගම් සහ පාලක සමාගම විසින්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එම පුද්ගලයා, හවුල් ව්‍යාපාරය, සමාගම හෝ සමාගම් සමූහයේ පාලිත සමාගම් සහ පාලක සමාගම මේ පනත යටතේ බදු ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කිරීම නීත්‍යානුකූල විය යුතු අතර ඒ සඳහා වැය වන මුදල, හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ යම් හවුල්කරුවකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයේ යම් අනුයෝජිතයකුගෙන් අයකර ගත යුතු ය.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ යම් විධිවිධාන අදාළ වීම

**5.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවධානවලට යටත්ව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX වන පරිච්ඡේදයේ, X වන පරිච්ඡේදයේ, XI වන පරිච්ඡේදයේ, XII වන පරිච්ඡේදයේ, XIII වන පරිච්ඡේදයේ, XIV වන පරිච්ඡේදයේ, XV වන පරිච්ඡේදයේ, XVI වන පරිච්ඡේදයේ, XVII වන පරිච්ඡේදයේ,

XVIII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, මේ පනත යටතේ පරිපාලන විධිවිධාන, වාර්තා තබාගැනීම සහ තොරතුරු රැස්කිරීම, බදු වාර්තා, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොළිය, බදු අයකර ගැනීම, දණ්ඩන සහ අපරාධ නඩු කටයුතු සඳහා අදාළ විය යුතු ය.

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඉහත කී යම් විධිවිධානවල ආදායම් බදු සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම, මේ පනතේ විධිවිධාන ප්‍රකාර අයකරනු ලබන සහ ගෙවනු ලබන බද්ද සම්බන්ධයෙන් වන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) 2024 දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පසු යම් පුද්ගලයකුට, හවුල් ව්‍යාපාරයකට, සමාගමකට හෝ සමාගම් සමූහයක පාලිත සමාගම්වලට සහ පාලක සමාගමට අදාළව පැහැර හරින ලද තක්සේරුවක්, සංශෝධිත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සකස් නොකළ යුතු ය.

අර්ථ නිරූපණය

**6.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සමාගම" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සමාගම් සමූහය" යන්නෙන් පාලක සමාගමක් සහ එහි පාලිත සමාගම් අදහස් වේ;

"පාලක සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක් හැර, වෙනත් සමාගමක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස්වලින් සියයට පනහක ප්‍රතිශතයකට වැඩියෙන්, සෘජුව හෝ වක්‍රව හිමිකාරීත්වය ඇති සමාගමක් අදහස් වේ;

"හවුල් ව්‍යාපාරය" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බදු වාර්තාව" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පාලිත සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලිත සමාගමක් හැර, ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස් ප්‍රමාණයක්, සෘජුව හෝ වක්‍රව වෙනත් සමාගමකට හිමිකාරීත්වය ඇති සමාගමක් අදහස් වේ;

"තක්සේරු වර්ෂය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20 වන වගන්තිය යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව